**අක්මීමන ප්‍රාදේශීය සභාව - 2023**

**------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

අක්මීමන ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ විස්තරය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශය මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක් වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට අක්මීමන ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශිය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2013 හා 2019 වර්ෂවල සභාවේ නමට පවරන ලද රු.7,521,373 ක් වටිනා වාහන 02 ක් හා සමාලෝචිත වර්ෂය තුළ මිලදී ගත් රු.92,000 ක් වටිනා ස්ථාවර වත්කම් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ඉදිරියේ දී නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුය. |
| (ආ) | ඉදිරි වර්ෂය වෙනුවෙන් ලද රු.308,511 ක වරිපනම්, කලින් ලද වරිපනම් යටතේ හා සමාලෝචිත වර්ෂයේ ලැබුණු උසාවි දඩ රු.1,050,000 ක් වර්ෂයේ ආදායම් යටතේ ද ගිණුම් ගතකර නොතිබුණි. | - එම - | - එම - |
| (ඇ) | මුද්දර ගාස්තු රු.318,629 ක් හා ස්ථාවර තැන්පතු රු.2,367,279 ක් වැඩියෙන් ගිණුම් ගත වී තිබුණි. | - එම - | - එම - |
| (ඈ) | නොගෙවූ වියදම් රු.48,193 ක් සඳහා ණයහිමි ප්‍රතිපාදන ඇතිකර නොතිබුණි. | - එම - | - එම - |
| (ඉ) | කර්මාන්ත ණයහිමි හා ණයගැති ශේෂය තුළ පෙන්නුම් කරන ලද රු.133,986 ක ශේෂය මුදලින් ලැබී ගෙවීම් කර තිබුණ ද, තවදුරටත් ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ තුළ පෙන්නුම් කර තිබුණි. | ඉදිරියේ දී නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුය. |
| (ඊ) | සභාව විසින් සිදු කරන ලද කර්මාන්ත 02 කට අදාළව රු.73,086 ක් ගෙවිය යුතු කර්මාන්ත යටතේ ගිණුම් ගතකර නොතිබුණි. | - එම - | - එම - |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 03 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදා+ළ උපයෝගී ලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.544,276 ක වෙනසක් පැවතුණි. | ඉදිරියේ දී නිවැරදි කරන බව. | වෙනස්කම් සසඳා ගිණුම නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.19,367,908 ක් වූ ගිණුම් විෂයයන් 05 ක් සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | ඉදිරියේ දී නිවැරදි කරන බව. | ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 19 | සියලුම උප පත්‍රිකා පොත් ලේකම්වරයා භාරයේ පැවතිය යුතු අතර, ඒවායේ සුරක්ෂිත භාවය හා නිසි භාවිතය පිළිබඳ ඔහු පෞද්ගලිකව වගකිවයුතු අතර, ඊට පටහැනිව ලදුපොත් 247 ක් ගබඩා භාරකරු යටතේ පැවතුණි. | සියළුම උප පත්‍රිකා පොත් වෙනම කබඩ් එකක ගබඩා කර ආරක්ෂිතව තබා ඇති බව. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.96,392,891 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.12,162,393 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්-තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 5,882,505 | 9,321,395 | 8,454,607 | 16,224,172 | 5,080,000 | 4,630,180 | 3,118,747 | 15,357,384 |
| කුලී | 2,508,600 | 2,597,335 | 2,609,002 | 689,811 | 43,595,000 | 2,339,200 | 2,177,217 | 701,478 |
| බලපත්‍ර ගාස්තු | 2,890,150 | 5,912,560 | 5,890,060 | 77,000 | 50,385,060 | 6,067,343 | 6,095,643 | 54,500 |
| වෙනත් ආදායම් | 21,891,070 | 23,232,625 | 23,164,335 | 739,130 | 53,060,600 | 10,140,566 | 10,016,566 | 670,840 |
| | 33,172,325 | 41,063,915 | 40,118,004 | 17,730,113 | 152,120,660 | 23,177,289 | 21,408,173 | 16,784,202 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට හිඟ මුළු ආදායම රු.16,784,202 ක් වූ අතර, වර්ෂ අවසානයට රු.17,730,113 ක ලැබිය යුතු ශේෂයක් පැවතුණි. | අය කිරීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් අයකර ගත යුතුය. |
| (ආ) | වර්ෂයට අදාළ වරිපනම් බදු ආදායමින් කිසිදු බදු මුදලක් නොගෙවූ ඒකක 6003 ක් පැවති අතර, එම ඒකක වලින් අයවිය යුතු වරිපනම් බදු ආදායම රු.14,773,222 ක් වීමෙන් සභාවේ ආදායම් අයකර ගැනීම දුර්වල මට්ටමක පැවතුණි. | ලිඛිතව දැනුම් දීමට කටයුතු කරන ලද බව. | හිඟ ආදායම් අයකර ගැනීමට වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුය. |
| (ඇ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.427,000 ක් හා මුද්දර ගාස්තු රු.200,652,483 ක් විය. | හිඟ ආදායම් අය කළ යුතුය. | හිඟ ආදායම් අය කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පිරිවැය රු.800,000 ක් වූ ට්‍රැක්ටරයේ එන්ජිම වසර 02 ක කාලයක සිට අක්‍රිය තත්ත්වයේ පැවති අතර, එය අළුත්වැඩියා කර භාවිතයට ගැනීම කෙරෙහි සභාවේ අවධානය යොමු වී නොතිබුණි. | එම ට්‍රැක්ටර් රථය අළුත්වැඩියා කිරීමෙන් පසු ධාවනය සඳහා යොදා ගන්නා බව. | වත්කම් කඩිනමින් අළුත්වැඩියා කළ යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බල ප්‍රදේශයේ ප්‍රදර්ශනය කර තිබූ දැන්වීම් පුවරු 40 ක් වෙනුවෙන් රු.1,084,300 ක ගාස්තුවක් අයකර ගෙන නොතිබුණි. | ගාස්තු නොගෙවන පුද්ගලයන් සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගනු ලබන බව. | අයවිය යුතු දැන්වීම් පුවරු ගාස්තු අය කළ යුතුය. |
| (ආ) | ව්‍යාපාරික ආයතන 15 ක් පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා ගැනීමෙන් තොරව ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමෙන් සභාවට රු.67,500 ක ආදායමක් අහිමි වී තිබුණි. | ඉදිරි කටයුතු සිදු කරන බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | සභා බල ප්‍රදේශය තුළ පිහිටි කර්මාන්ත 36 කට අදාල බලපත්‍ර අළුත් කිරීමට සභාව විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබීමෙන් රු.162,000 ක ආදායමක් අහිමි වී තිබුණි. | පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබා දීම සඳහා කටයුතු කරමින් පවතින බව. | ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදුකර බලපත්‍ර ලබා දීමට කටයුතු කළ යුතුය. |

### 3.3 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව සතු ඉඩම් 39 ක පිඹුරු පත් සභාව තුළ නොතිබූ අතර, ඉඩම් 15 ක හිමිකම් ඔප්පු සභාව සතු නොවීය. | ප්‍රාදේශීය සභාව වෙත පවරා ගැනීමට කටයුතු කරමින් සිටින බව. | ඉඩම් වල හිමිකම් ඔප්පු ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2012 වර්ෂයේ දී සභාවට ලබා දී තිබුණු රු.1,650,000 ක් වටිනා වාහන 04 ක් සහ සභාව මිලදී ගෙන තිබූ පිරිවැය රු.600,000 ක් වූ ජල බවුසර් 02 ක් සභාව නමින් ලියාපදිංචි කර නොතිබුණි. | මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්ගෙන් විමසා ඇති බව. | සභාව සතු වත්කම් පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | පිරිවැය රු.700,000 ක් වූ ගලි බවුසරය 2020 වර්ෂයේ සිට නිෂ්කාර්යව පැවතුණි. | අළුත්වැඩියා කිරීමෙන් පසු ගලි සේවාව ආරම්භ කිරීමට කටයුතු කරන බව. | වත්කම් පූර්ණව උපයෝජනය කළ යුතුය. |
| (ඈ) | 2019 වර්ෂයේ කසළ ප්‍රවාහනය සඳහා ලැබී තිබුණු රු.6,221,373 ක් වටිනා කම්පැක්ටරය ඌන උපයෝජිත තත්ත්වයේ පැවතුණි. | නොදිරන කසළ පමණක් කම්පැක්ටර් රථය භාවිතා කරන බව. | වත්කම් පූර්ණව උපයෝජනය කළ යුතුය. |
| (ඉ) | 2018 වර්ෂයේ හා ඊට පෙර සභාව විසින් රු.98,995 ක් ගෙවා මිලදී ගෙන තිබුණු විදුලි තොග වර්ග 14 කට අයත් අයිතම 90 ක් ප්‍රයෝජනයට ගැනීමෙන් තොරව ගබඩාවේ පැවතුණි. | අවශ්‍ය නඩත්තු කටයුතු සඳහා එම අයිතමයන් යොදා ගැනීම සඳහා ගබඩාවේ තබා ගැනීමට සුදුසු බව. | අවශ්‍යතාවය සලකා බලා ප්‍රසම්පාදනය සිදුකළ යුතුය. |

**3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මාර්ග සංවර්ධනය කිරීමේ කර්මාන්ත 03 ක් සඳහා නියමිත මිල අනුපාත භාවිතා නොකිරීම නිසා එම කර්මාන්ත 03 වෙනුවෙන් රු.349,538 ක් වැඩිපුර ගෙවා තිබුණි. | මිල ගණන් නිකුත් කිරීම පිළිබඳ දැනුවත් නොවීම. | නියමිත මිල අනුපාත භාවිතා කළ යුතුය. |
| (ආ) | මාර්ග සංවර්ධන කටයුතු සඳහා පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් හඳුන්වා දී තිබුණු මිල ගණන් භාවිතා නොකිරීම නිසා කර්මාන්ත 21 කට අදාළව රු.596,404 ක් වැඩිපුර ගෙවා තිබුණි. | මෙම මිල ගණන් භාවිතා කරනු ලබන්නේ දීර්ඝකාලීන ව්‍යාපෘති වලට බව. | නියමිත මිල අනුපාත භාවිතා කළ යුතුය. |

**3.5 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ සේවයකර සේවයෙන් පහකළ නිලධාරියෙකුගෙන් අයවිය යුතු ණය ශේෂය රු.132,191 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 1998 වර්ෂයේ සිට අයවිය යුතු ණය ශේෂයක් බව. | හිඟ ණය ශේෂ අයකර ගත යුතුය. |